# ලංකා බැංකුව

## ශ්‍රී ලංකාවේ අංක 1 බැංකුව හා එක්ව සමෘද්ධිමත් වෘත්තියක් නිර්මාණය කරගන්න !

බැංකුකරණ වෘත්තියෙන් ඉදිරියට යාමට අපේක්ෂාකරන සුදුසුකම් ලත්, තරුණ, උද්‍යෝගිමත් අරමුණු වෙත හඹායන පුද්ගලයන්ගෙන් පහත දැක්වෙන තනතුර සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

## කළමනාකරණ අභ්‍යාසලාභී

(මෙම තනතුර සඳහා පුරප්පාඩු පවතින්නේ උතුරු, නැගෙනහිර, උතුරු මැද, වයඹ සහ ඌව පළාත්වල පමණකි)

## යෝග්‍යතා නිර්ණායක

➢ **ශ්‍රී ලාංකීය පුරවැසියකු විය යුතුය.**

➢ **සුදුසුකම් සහ පළපුරුද්ද**

අ) පහත සඳහන් කුමන හෝ විෂය ක්ෂේත්‍රයක, ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන දේශීය හෝ විදේශීය විශ්වවිද්‍යාලයකින්, අවම වශයෙන් දෙවන පන්තියේ ඉහළ පෙළ සාමාර්ථයක් හෝ ලකුණු 4.0ක උපරිමයකින් අවම වශයෙන් 3.5ක ශ්‍රේණි ලකුණු සාමාන්‍යයක් (GPA) සහිත උපාධියක් ලබාගෙන තිබීම:

ආර්ථික විද්‍යාව, සංඛ්‍යානය, ගණිතය, ගිණුම්කරණය, බැංකුකරණය, මූල්‍ය, වාණිජ්‍යය, ව්‍යාපාර පරිපාලනය, කළමනාකරණය (රාජ්‍ය/මූල්‍යමය/ගිණුම්කරණය/ව්‍යාපාර),අලෙවිකරණය, මානව සම්පත්, ඉංජිනේරු, පරිගණක විද්‍යාව, භෞතික විද්‍යාව, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය, නීතිය, අන්තර්ජාතික ව්‍යාපාරකරණය, තක්සේරුකරණය, කෘෂිකර්මය හෝ බැංකුව විසින් තීරණය කරනු ලබන බැංකුකරණය හා මූල්‍යයට අදාළ වෙනත් යම් ක්ෂේත්‍රයක්

හෝ

ආ) ඉහත අ) ඡේදයෙහි සඳහන් කුමන හෝ විෂය ක්ෂේත්‍රයක ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන දේශීය හෝ විදේශීය විශ්වවිද්‍යාලයකින් ලබාගත් ශාස්ත්‍රපති හෝ ඊට ඉහළ මට්ටමේ පශ්චාත් උපාධියක් සමග උපාධියක් ලබාගෙන තිබීම.

හෝ

ඇ) බැංකුවක හෝ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අවසර ලත් මූල්‍ය ආයතනයක අවම වශයෙන් වසරක (01) විධායක මට්ටමේ පළපුරුද්දක් සහිතව ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ (IBSL) හෝ එක්සත් රාජධානියේ වරලත් බැංකුකරුවන්ගේ ආයතනයේ (CIB) ආශ්‍රිත සාමාජිකයකු වීම

හෝ

ඈ) පිළිගත් ආයතනයක වසර දෙකක (02) විධායක මට්ටමේ පළපුරුද්දක් සමග පහත සඳහන් වෘත්තීය ගිණුම්කරණ ආයතනයක ආශ්‍රිත සාමාජිකයකු වීම හෝ,

ඉහත අ) ඡේදයෙහි සඳහන් කුමන හෝ විෂය ක්ෂේත්‍රයක, ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන දේශීය හෝ විදේශීය විශ්වවිද්‍යාලයකින් ලබාගත් උපාධියක් සමග පහත සඳහන් ඒවා අතුරින් එකක පූර්ණ සුදුසුකම් ලබා තිබීම (අවසන් විභාගය සමත් වීම):

- ✓ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය (ICA-SL)
- ✓ වරලත් සහතිකලත් ගණකාධිකාරී සංගමය (ACCA-UK)
- ✓ CFA ආයතනයේ වරලත් මූල්‍ය විශ්ලේෂක පාඨමාලාව (CFA-USA)
- ✓ එක්සත් රාජධානියේ කළමනාකරණ ගණකාධිකාරීවරුන්ගේ වරලත් ආයතනය (CIMA-UK)
- ✓ එංගලන්තයේ සහ වේල්ස් හි වරලත් ගණකාධිකාරී ආයතනය(ICA-EW)

හෝ

ඉ) අවසන් විභාගයේදී ගෞරව සාමාර්ථයක් සහිතව, බැංකුවක හෝ පිළිගත් මූල්‍ය ආයතනයක අවම වශයෙන් වසර දෙකක (02) විධායක මට්ටමේ පළපුරුද්දක් සහිත නීතිඥවරයකු/ වරියක වීම.

➢ **වෙනත් ගුණාංග**

- ☞ ධනාත්මක චින්තනයෙන් බැංකුවේ අරමුණු ළඟාකරගැනීමට කැපවීමෙන් යුතුව කටයුතු කිරීම
- ☞ පීඩනයන් යටතේ වුවද ඵලදායී ලෙස කාර්යයන් හි නිරතවීමේ හැකියාව
- ☞ නායකත්ව ගුණාංගයන්ගෙන් යුක්තවීම
- ☞ අන්තර් පුද්ගල කුසලතා සහ කණ්ඩායමක් ලෙස කටයුතුකිරීමේ හැකියාව
- ☞ තොරතුරු තාක්ෂණය පිළිබඳ සාක්ෂරතාව
- ☞ ඉංග්‍රීසි සහ සිංහල/ දෙමළ භාෂා පිළිබඳ ප්‍රවීනතාව

➢ **වයස**

අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 28ක් හෝ ඊට අඩු විය යුතුය.

## නියමයන් සහ කොන්දේසි

➢ පුහුණු කාල සීමාව වසර දෙකක් (02) වන අතර, පුහුණු කාලය තුළ (පළමු වසර සඳහා – මසකට රු.90,000/– බැගින් හා දෙවන වසර සඳහා – මසකට රු. 100,000/– බැගින්) මාසික දීමනාවක් ගෙවනු ලැබේ.

➢ මෙම තනතුර සාමාන්‍ය බැංකු ක්ෂේත්‍රයේ (විවෘත සේවය) සාමාන්‍ය නියමයන් හා කොන්දේසිවලට යටත් වේ.

➢ පුහුණු කාලසීමාවේ බැංකුව සෑහීමට පත්වන ආකාරයට අවශ්‍යතා සපුරාලීමෙන් පසු සුදුසු බව පෙනී ගියහොත් පමණක් බැංකු සේවයේ ස්ථිර කාර්‍ය මණ්ඩලයේ විධායක නිලධාරී ශ්‍රේණියේ ස්ථිර කරනු ලැබේ.

➢ කාර්‍යාල වේලාවට අමතරව සති අන්ත/නිවාඩු දිනවල සේවයෙහි යෙදීම අපේක්ෂා කෙරේ.

➢ කළමනාකාරීත්වය විසින් වෙනත් ආකාරයකින් තීරණය කරනු ලැබුවහොත් මිස, අභ්‍යාසලාභීන් අවම වශයෙන් වසර පහක(05) අනිවාර්ය කාල සීමාවක් (පුහුණු කාලය ඇතුළුව) තමාව අනුයුක්ත කර ඇති පළාතේ සේවය කළ යුතුය.

## තෝරාගැනීමේ පටිපාටිය

- ■ තරග විභාගයකින් අනතුරුව ලැයිස්තුගත කරනු ලබන (shortlisted) අපේක්ෂකයන් සඳහා පැවැත්වෙන සම්මුඛ පරීක්ෂණයක්/ පරීක්ෂණ මගින් තෝරාගනු ලැබේ.
- ■ තෝරාගැනීම් ඉහත අදාළ පළාත් පහේ අවශ්‍යතා මත පදනම් වේ.
- ■ විභාගයේදී පහත ප්‍රශ්න පත්‍ර සලකා බලනු ලැබේ:
  - I ප්‍රශ්න පත්‍රය – විශ්ලේෂණාත්මක කුසලතා (IQ), සාමාන්‍ය දැනීම සහ තොරතුරු තාක්ෂණය
  - II ප්‍රශ්න පත්‍රය– ඉංග්‍රීසි භාෂාව
  - III ප්‍රශ්න පත්‍රය – ආකල්ප පරීක්ෂණය
- ■ තරග විභාගයෙන් ලබාගත් ලකුණු සම්මුඛ පරීක්ෂණය සඳහා අපේක්ෂකයන් ලැයිස්තුගත කිරීම සඳහා පමණක් භාවිතා කරනු ලැබේ. අවසාන තෝරාගැනීම් සිදුකරනු ලබන්නේ සම්මුඛ පරීක්ෂණයේදී ලබා ගන්නා ලකුණු මත පමණක් පදනම්ව ය.

## අයදුම් කිරීමේ පටිපාටිය

අපගේවෙබ්අඩවිය වන **www.boc.lk** (**"careers"** තීරය) යටතේ බාගත හැකි ආදර්ශ අයදුම්පත භාවිතයෙන් සකසන ලද ඔබගේ ජීවදත්ත පත්‍රිකාව, උප්පැන්න සහතිකයේ, ජාතික හැඳුනුම්පතේ, අදාළ සියලුම අධ්‍යාපනික හා වෘත්තීය සහතිකපත්වල සහ ඔබේ පළපුරුද්ද සනාථකිරීමේ සහතික/ ලේඛනගත සාක්ෂිවල ඡායාස්ථ පිටපත් සමග **2024 ජූලි මස 20 වන දින හෝ ඊට පෙර** අප වෙත ලැබෙන සේ පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතුය.

**පුරප්පාඩු ඇත්තේ උතුරු, නැගෙනහිර, උතුරුමැද, වයඹ සහ ඌව පළාත්වල පමණක් වන අතර, අපේක්ෂකයා අයදුම්පත බහා එවන ලියුම් කවරයේ වම් පස ඉහළ කෙළවරේ තමා අයදුම් කර ඇති තනතුර සහ පළාත සඳහන් කළ යුතුය.**

**කිසියම් අපේක්ෂකයකු විවිධ පළාත් සඳහා අයදුම්පත් එකකට වඩා ඉදිරිපත් කරන්නේ නම්, සියලුම අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලබන අතර, තනතුර සඳහා අයදුම් කිරීම සඳහා නුසුදුස්සකු ලෙස සලකනු ලැබේ.**

උපාධියේ සහ අනෙකුත් වෘත්තීය සුදුසුකම්හි වලංගු දිනය අයදුම්පත් භාරගන්නා අවසන් දිනට හෝ ඊට පෙර විය යුතුය.

අයදුම්පත් භාරගන්නා අවසන් දිනට ඉහත නියමිත යෝග්‍යතා නිර්ණායක සපුරානොමැති හෝ අදාළ සනාථ කිරීමේ ලේඛනවල ඡායාස්ථ පිටපත් නොමැතිව හෝ සාවද්‍ය තොරතුරු ඉදිරිපත්කරන හෝ අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පසුව එවන ඕනෑම අයදුම්පතක් කිසිදු දැනුම්දීමකින් තොරව බඳවා ගැනීමේ ඕනෑම අදියරකදී ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**ප්‍රධාන කළමනාකරු (බඳවාගැනීම් හා වෘත්තීය සංවර්ධන)**
**ලංකා බැංකුව,**
**26 වන මහල - ප්‍රධාන කාර්යාලය**
**"ලංකා බැංකු චතුරශ්‍රය"**
**අංක 1, ලංකා බැංකු මාවත,කොළඹ 01.**

- ❋ බැංකුව වෙත කිසිම ආකාරයක බලපෑමක් කිරීම ඔබ මෙම තනතුර සඳහා වහාම නුසුදුසුභාවයට පත්කිරීමට හේතුවේ.
- ❋ තෝරාගනු ලබන අයදුම්කරුවන් පමණක් කැඳවීමේ අයිතිය බැංකුව සතුය.
- ❋ සම්පූර්ණ කළ යුතු තනතුරු සංඛ්‍යාව හෝ බඳවාගැනීම කල්දැමීමේ/ අවලංගුකිරීමේ අයිතිය බැංකුව සතුය.
- ❋ බැංකුවේ පෞද්ගලික දත්ත ආරක්ෂණ ප්‍රතිපත්තියට අනුව, බැංකුව විසින් ඔබේ තොරතුරුවල පෞද්ගලිකභාවය හා රහස්‍යභාවය ආරක්ෂාකරනු ලැබේ.